**(iv) දොරට වැඩුම උත්සවය සංවිධාන කිරීම සඳහා සිද්ධි කළමනාකරුවෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ නම් එම උත්සවය සැලසුම් කිරීමට අදාළ කාර්ය හතරක් විස්තර කරන්න.**

- සිද්ධි තේමාව/ ඉලක්කය හා අරමුණු හඳුනාගැනීමට
- මූල්‍ය පිරිවැය හා එය සැලසුම් කිරීම
- අනුග්‍රාහක අවස්ථා සැලසුම් කිරීම හා ලබාගැනීම
- ඉලක්ක කණ්ඩායම හඳුනා ගැනීම
- අදාළ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව සමග සම්බන්ධීකරණය ගොඩනැගීම
- පාරිභෝගික සේවා සැලසුම් කිරීම
- හදිසි අවස්ථා සැලසුම් කිරීම
- ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීම
- පිටපත ලිවීම
- ස්ථානයක් වෙන් කරගැනීම
- ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් නිෂ්පාදනය
- ප්‍රවර්ධන කටයුතු සැලසුම් කිරීම
- න්‍යායපත්‍රය සැකසීම
- කාල වේලාවන් සැලසුම් කිරීම

ලකුණු 4 x 4 = 16



Scanned with CamScanner

**4. සංවර්ධනය හා සංස්කෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සන්නිවේදනය සමඟ අවියෝජනීය ලෙස බැඳී පවතී.**

**(i) සංවර්ධන කාර්යයේ දී ඒ ඒ රටවලට යෝග්‍ය වූ විධික්‍රම අදාළ රටවල් විසින්ම නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම හැඳින්වීම සඳහා භාවිත යෙදුම කුමක් ද?**

ලකුණු = 4

ප්‍රදේශීයකරණය

**(ii) 'සංස්කෘතිය' යන්න ඊ. බී. ටයිලර්ගේ නිර්වචනය ඇසුරෙන් පැහැදිලි කරන්න.**

දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබාගත් අනෙකුත් කුමන විධියක හෝ පුරුදු හෝ හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තය යි.

(ඉහත නිර්වචනයේ අන්තර්ගත කරුණු ඇසුරින් සංස්කෘතිය යන්න පැහැදිලි කර තිබිය යුතුය.)

| | | |
|---|---|---|
| නිර්වචනයට ලකුණු | = | 4 |
| විස්තර කිරීම ලකුණු | = | 4 |
| මුළු ලකුණු | = | 8 |

**(iii) පාර්ශ්ව දෙකක් හෝ කිහිපයක් අතර ඇති විය හැකි ගැටුම් නිරාකරණය කිරීම සඳහා පහත පියවර යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.**

(අ) ගැටුම අවබෝධ කර ගැනීම

- ගැටුමට හේතු වූ කරුණු අවබෝධ කර ගැනීම
- ගැටුමේ තීව්‍රතාව හා එයට සම්බන්ධ වූ පාර්ශව හඳුනා ගැනීම
- සිදුවීමට අදාළ වටපිටාව/ සන්දර්භය හඳුනාගැනීම

(ආ) විසඳුමක් තෝරා ගැනීම

- ගැටුම නිරාකරණය කරගැනීමට යෝජනා කළ හැකි විසඳුම් කවරේදැයි තීරණය කිරීම
- අදාළ විසඳුම් ඇගයීම
- වඩාත් යෝග්‍ය විසඳුම් තෝරාගැනීම

(ඉ) මැදිහත්කරුවකු ලෙස තෙවන පාර්ශ්වයක් යොදා ගැනීම

- අදාළ සිද්ධිය/ පරිසරය පිළිබඳ දැනුමක්/ අවබෝධයක් සහිත පුද්ගලයෙකු පිළිබඳ අවධානය යොමු කිරීම
- ගැටුම් නිරාකරණය කිරීම සඳහා එකී පුද්ගලයාට ඇති ශක්‍යතාව තහවුරු කරගැනීම
- පාර්ශව දෙක අතර සම්බන්ධතාව හා සන්නිවේදනය සඳහා යෝග්‍ය මධ්‍යස්ථ තුන්වන පාර්ශවයක් මැදිහත්කරුවෙකු ලෙස තෝරා ගෙන අවශ්‍ය කටයුතු කිරීමට එකී තැනැත්තාට අවස්ථාව සලසාදීම

ලකුණු 4 x 3 = 12



Scanned with CamScanner

**(iv)** **ජනප්‍රිය සංස්කෘතියේ දක්නට ලැබෙන පහත ලක්ෂණ රූපවාහිනී මාධ්‍යට විශේෂිතව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.**

**(අ) නොගැඹුරු හා සරල වීම**

- රූපවාහිනියේ විකාශය වන සන්දේශ සාමාන්‍ය ග්‍රාහකයාට පහසුවෙන් තේරුම් ගත හැකි ලෙස ඉදිරිපත්වීම. වඩාත් සංකීර්ණ හා දුරාවබෝධ දෑ අන්තර්ගත නොවීම.
  උදා:- රියලිටි වැඩසටහන්, මෙගා ටෙලිනාට්‍ය
- සරළ භාෂා භාවිතය හා ජනප්‍රිය ආකෘති යොදාගැනීම

**(ආ) මහා පරිමාණිකව නිෂ්පාදනය වීම**

- ග්‍රාහක අවශ්‍යතා/ රුචි අරුචිකම් වලට ගැළපෙන විවිධාකාර වැඩසටහන් විශාල ~~ප්‍රමාණයෙන් නිෂ්පාදනය කිරීම~~

**(ඉ) කලාත්මක මට්ටම හීන වීම**

- සෞන්දර්යාත්මක වටිනාකම පිළිබඳ අවධානය අඩුවීම
- අඩු මුදලක්, අඩු කාලයක් වැය කර නිර්මාණ ඉදිරිපත් කිරීමට පෙළඹීම නිසා කලාත්මක මට්ටම හීනවීම
- අත්දැකීම්, පුහුණුව, පළපුරුද්ද සහිත ප්‍රවීණ වෘත්තිකයන්ගේ දායකත්වය අඩුවීම ද ඊට හේතු විය හැකිය.

  උදා:- මෙගා ටෙලිනාට්‍ය, රියැලිටි වැඩසටහන්

**(ඊ) සදාචාරාත්මක ගැටලුවලට හේතු වීම**

- සම්මත ඇවතුම් පැවතුම් පිළිබඳ අඩු අවධානයක් යොමු කිරීම
- ලාභ අපේක්ෂාව හේතුවෙන් ගුණාත්මක තත්වය පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වීම
- භාවාත්මක, සංවේදී තොරතුරු නිර්මාණ සඳහා යොදාගැනීම නිසා මෙවැනි ගැටලු නිර්මාණයවීම

උදා:- ටෙලිනාට්‍ය, රියැලිටි වැඩසටහන්, වෙළඳ දැන්වීම්

| | |
|---|---|
| විස්තර කිරීම ලකුණු | 3 x 4 = 12 |
| උදාහරණ දැක්වීම ලකුණු | 1 x 4 = 4 |
| මුළු ලකුණු | 16 |



Scanned with CamScanner

**5. 'මාධ්‍ය නියාමනයේ සමාජ අවශ්‍යතාව' මැයෙන් සිදුකරන මත විමසීමේ සමීක්ෂණයක දත්ත රැස්කරන්නෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ යැයි සිතන්න.**

**(i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මාධ්‍ය නියාමන ආයතන දෙකක් නම් කරන්න.**

- ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය
- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

ලකුණු 2 x 2 = 4

**(ii) මූලික සමීක්ෂණ වර්ග දෙක කෙටියෙන් පැහැදිලි කරන්න.**

- **විස්තරාත්මක සමීක්ෂණ :-**
  * විස්තරාත්මක සමීක්ෂණයක අරමුණු වන්නේ පවත්නා යම් තත්ත්වයක් හෝ සිදුවීමක් පිළිබඳව තොරතුරු එක්රැස් කර, ඒ පිළිබඳ විස්තර කිරීම හඳුනාගැනීම හෝ අර්ථකථනය කිරීමයි.
  * කිසියම් ගැටලුවක් පිළිබඳ විවිධ මාන වලින් තොරතුරු ඒකරාශී කිරීම
  * මෙම දත්ත, සිද්ධිය හෝ බලපෑම පිළිබඳ ගැඹුරින් අවධානය යොමු නොකරයි.
  * ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු රැස් කරයි.
    උදා: රූපවාහිනී වෙළඳ දැන්වීම් ප්‍රමාණය, වර්ගය, කාලය ආදිය පිළිබඳව දත්ත රැස් කළ හැකිය.

- **විග්‍රහාත්මක සමීක්ෂණ :-**
  * විග්‍රහාත්මක සමීක්ෂණයක අරමුණු වන්නේ යම් පවත්නා තත්ත්වයක් හෝ සිදුවීමක් පිළිබඳව තොරතුරු එක්රැස් කර එම සිදුවීමට අදාළ හේතු හා ඒවායේ අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීම හා පැහැදිලි කිරීමයි.
  * කිසියම් ගැටලුවක් හෝ අවස්ථාවක් හෝ වැඩසටහනක් හෝ පිළිබඳව විද්‍යාත්මක ප්‍රවේශයකින් සොයා ගන්නා දත්ත අදාළ සමීක්ෂණයේ අරමුණුවලට යටත්ව විග්‍රහාත්මකව විමසා බලයි.
  * මෙහිදී ගැටලුවක් විවිධ මානවලින් විශ්ලේෂණය කරයි.

  උදා:
  - සමාජ මාධ්‍යයෙන් ප්‍රචලිත වන තොරතුරු මගින් සිදුවන සමාජ බලපෑම කෙබඳුද
  - වෙළඳ ප්‍රචාරණ දැන්වීමකින් භාණ්ඩයක් මිලදී ගැනීමේ දී ග්‍රාහකයාට සිදු කරන බලපෑම කෙබඳු ද? ආදී ගැටලු පිළිබඳ මෙමගින් විමසා බැලිය හැකිය.

ලකුණු 4 x 2 = 8



Scanned with CamScanner

(iii) ඉහත සමීක්ෂණය සඳහා දත්ත රැස්කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාරධර්ම තුනක් විස්තර කරන්න.

* දත්ත රැස් කිරීමේ දී ගුණාත්මකභාවය හා ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම
* දත්ත හිතාමතා විකෘති නොකිරීම
* වැරදි දත්ත ඇතුළත් නොකිරීම
* දත්ත දායකයාගේ කැමැත්ත මත පමණක් සමීක්ෂණය සඳහා සහභාගී කර ගැනීම
* සමීක්ෂණය පිළිබඳ හා පර්යේෂණයේ මූලික අරමුණු පිළිබඳව දත්ත දායකයා දැනුවත් කිරීම
* දත්ත දායකයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම
* නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම
* දත්ත දායකයාගේ ආරක්ෂාව තහවුරු කිරීම
* දත්ත ලබා ගැනීමේ දී සමීක්ෂකගේ බලය අයුතු ලෙස යොදා නොගැනීම
* බුද්ධිමය දේපල අයුතු ලෙස භාවිත නොකිරීම
* අපක්ෂපාතීව කටයුතු කිරීම සහ තම පෞද්ගලික මතය සමීක්ෂණ ක්‍රියාවලියට ඇතුළුවීමට ඉඩ නොහැරීම
* දත්ත සුරක්ෂිතව ගබඩා කිරීම

ලකුණු 4 X 3 = 12

(iv) ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පහත කරුණු යටතේ උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

(අ) මහජන සාමය ආරක්ෂා කිරීම

* ජාතිකත්වය, වාර්ගිකත්වය සහ ආගමික වශයෙන් සමානාත්මතාවය බිඳ වැටෙන සන්දේශ නියාමනය කිරීම
  උදා: ජන වර්ග අතර කැලඹීමක් ඇති වන ආකාරයට ප්‍රවෘත්ති වාර්තා කිරීම
* ගැටුම්කාරී පරිසරයක් ඇතිවීම නියාමනය කිරීම
  උදා: දේශපාලන මැතිවරණ අවස්ථා
* දිවි නසාගැනීම් හා දරුණු අපරාධ වැනි දේ සවිස්තරාත්මකව ප්‍රචාරණය කිරීමේ දී නියාමන සිදු කිරීම
* භාව ප්‍රකෝපවන ආකාරයේ සන්දේශ නියාමනය කිරීම
  උදා: පවුල් ආරවුල්, උද්ඝෝෂණ, තරුණ කණ්ඩායම් අතර ගැටුම්

(ආ) තනි පුද්ගල අයිතීන්ට සිදු වන බලපෑම පාලනය කිරීම

* පුද්ගල ප්‍රතිරූපය බිඳවැටෙන පරිදි ප්‍රචාරය කරනු ලබන ව්‍යාජ තොරතුරු නියාමනය කිරීම.
* ක්‍රීඩකයින්, කලාකරුවන්, දේශපාලඥයින්, වෛද්‍යවරු ආදී විවිධ ක්ෂේත්‍රවල නියැළුණු පුද්ගලයින්ගේ ආත්ම අභිමානය හෑල්ලුවට ලක්කිරීම නියාමනය කිරීම.
* ස්ත්‍රී දූෂණ, අපරාධ සම්බන්ධ පුද්ගලයින්ගේ නම්, ගම් ප්‍රසිද්ධ කිරීම මගින් පෞද්ගලිකත්වයට හානි වන තොරතුරු නියාමනය කිරීම.
* ප්‍රසිද්ධ චරිතවල ඥාතිත්වය පදනම් කරගෙන සිදු කරන අපහාස කිරීම් නියාමනය කිරීම.
* වෛවාහික කරුණු පිළිබඳ වාර්තා කිරීමේ දී සැලකිලිමත්වීම.

විස්තර කිරීම ලකුණු 6 X 2 = 12
උදාහරණ දැක්වීම ලකුණු 2 X 2 = 4
මුළු ලකුණු = 16



Scanned with CamScanner

**6. මානව සන්නිවේදන ක්‍රියාවලිය කාලානුරූපීව නවීකරණය වෙයි.**

**(i) සම්ප්‍රදායික මාධ්‍යවල ලක්ෂණ දෙකක් ලියන්න.**

* සරල ව්‍යුහය
* තේමාත්මක අන්තර්ගතය
* නම්‍යශීලීත්වය
* සංස්කෘතික සන්දර්භය
* අවම පිරිවැය
* පරිසරයෙන් සපයා ගත හැකි සම්පත් යොදා ගැනීම
* විශ්වාස හා ගරුකිරීම
* පොදු පිළිගැනීම හා පොදු යහපත
* පාරම්පරිකව උරුමවීම
* දේශීය සංස්කෘතික අනන්‍යතාව
* භාවිතය පහසුවීම
* නියත කර්තෘත්වයක් නොමැතිවීම
* ජන මූල පදනම

(ලකුණු 2 x 2 = 4)

• නිර්මාණශීලීත්වය
• අන්තර්ක්‍රියාකාරීත්වය.

**(ii) සන්නිවේදනය සඳහා භාවිත සමාජ මාධ්‍ය යෙදවුම් දෙකක ක්‍රියාකාරීත්වය කෙටියෙන් විස්තර කරන්න.**

- **ෆේස්බුක් (Facebook)**
  * අනන්‍යයන් සමග සබඳතා ගොඩනගා ගත හැකිවීම
  * සජීවී විස්තර ප්‍රචාරය කළ හැකිවීම
  * ඡායාරූප හා වීඩියෝ සමාජ මාධ්‍ය ජාලයට එක් කළ හැකිවීම
  * ආයතන, පුද්ගල ප්‍රවර්ධනය සිදුකළ හැකිවීම
- **වට්ස්ඇප් (Whatsapp)**
  * මාර්ගගත ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය ඇමතුම් ලබාගැනීම
  * කෙටි පණිවිඩ, හඬ, ඡායාරූප හා වීඩියෝ බෙදා හැරීමේ හැකියාව
  * විවිධ අරමුණු සඳහා කණ්ඩායම් නිර්මාණය කර ගෙන සන්නිවේදනය කිරීම
  * මාර්ගගත අධ්‍යාපනය සඳහා යොදා ගැනීම
- **ට්විටර් (Twitter)** / X [illegible]
  * කෙටි පණිවිඩ හුවමාරු කළ හැකිවීම
  * පුද්ගල හා ආයතනික නිල ගිණුම් මගින් පණිවිඩ නිකුත් කිරීම
- **ලින්ක්ඩ්ඉන් (Linkedin)**
  * වෘත්තීය මට්ටමින් ක්‍රියාත්මක ජාලයකි.
  * වෘත්තීය හා ව්‍යාපාරික ප්‍රජාව අතර ප්‍රචලිත සමාජ ජාලයකි.
- **පින්ටරෙස්ට් (pinterest)**
  * ඡායාරූප වර්ගීකරණය හා බෙදාහැරීම සඳහා වන ජාලයකි.
  * ඡායාරූපය ඔස්සේ ඒ පිළිබඳ වැඩි විස්තර වෙත ප්‍රවේශ වීමට හැකිවීම
- **ඉන්ස්ටග්‍රෑම් (Instagram)**
  * ඡායාරූප හා වීඩියෝ බෙදා හැරීමේ සමාජ මාධ්‍යයකි.
  * Facebook, Twitter වැනි සමාජ ජාලා වෙත මේ ඔස්සේ ඡායාරූප යොමු කළ හැකිය.
- **ස්කයිප් (Skype)**
  * වීඩියෝ, හඬ සහිතව ඇමතුම් මගින් කණ්ඩායම් සම්මන්ත්‍රණ සිදු කළ හැකිවීම
- **වයිබර් (Viber)**
  * කෙටි පණිවිඩ, හඬ, ඡායාරූප හා වීඩියෝ බෙදා හැරීමේ හැකියාව පවතී.
  * පරිශීලකයන් නොවන අය සමග ද සන්නිවේදනය කළ හැකිය.

• ටික් ටොක්
U-ටියුබ් [illegible]

(ලකුණු 4 x 2 = 8)



Scanned with CamScanner

**(iii) මාධ්‍ය අන්තර්ගතය නිර්මාණය කිරීමේ දී කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) යොදා ගත හැකි ආකාරය පහත අවස්ථාවලට විශේෂිතව විස්තර කරන්න.**

**(අ) ගීත නිර්මාණකරණය**

- අපට අවශ්‍ය තේමාවට හා රස භාවයට අදාළව සුදුසු භාෂාවෙන් AI තාක්ෂණය ඔස්සේ ගීතය රචනා කිරීම
  උදා: තේමාවට - ජන සංස්කෘතියට, බටහිර සංස්කෘතියට
  රසභාවයට - ආදරය, විරහව, කරුණාව, භක්තිය
- තෝරා ගත් ගායකයෙකුගේ හෝ ගායිකාවකගේ කටහඬ ලබා දුන් පසු මෙම තාක්ෂණයෙන් ගීතය ගායනා කිරීම
- පරිගණක වැඩසටහන්, මෘදුකාංග භාවිතයෙන් සංගීත සංරචනාව AI තාක්ෂණයෙන් නිර්මාණය කරයි.
- ගීතයට අදාළ රූප රචනයක් නම් AI තාක්ෂණයෙන් උපදෙස් ලබා දී අවශ්‍ය පරිදි සිදුකිරීම
- වයෝවෘද්ධ හෝ මියගිය ගායකයෙකුගේ රූපය, කටහඬ ඔහුගේ තරුණ කාලයට අනුරූපව AI තාක්ෂණය මගින් නිර්මාණය කළ හැකිවීම

APP - SUNO
LoLedy

**(ආ) රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කිරීම**

- AI තාක්ෂණය මගින් රූපවාහිනී වැඩසටහනට අදාළ තේමාව ඔස්සේ තිර පිටපත රචනා කිරීම
- එම වැඩසටහනට අවශ්‍ය පසුතලය නිර්මාණයද AI තාක්ෂණයෙන් සකස් කිරීම
- වැඩසටහනට ගැළපෙන නිවේදක නිවේදිකාවන්ගේ රූපය, කටහඬ AI තාක්ෂණයෙන් භාවිත කිරීම
- මේ සියල්ල මානව එළඹුමකින් තොරව ස්වයංක්‍රීයව සිදු කරයි
- නිශ්චල ඡායාරූප, සජීවී අංග චලන සහිතව යොදා ගැනීමට හැකිවීම
- වැඩසටහන ඉදිරිපත් කිරීමේ දී නිවේදක, නිවේදිකාවන්ගේ අංග චලන, අභිනයන් AI තාක්ෂණය මගින් වෙනස් කළ හැකිවීම

ලකුණු 6 x 2 = 12

**(iv) නිර්මහාපරිමාණකරණයේ ලක්ෂණ පහත මාධ්‍යවලට විශේෂිතව නිදසුන් දක්වමින් පහදන්න.**

**(අ) මුද්‍රිත මාධ්‍ය**

- ග්‍රාහක ක්ෂේත්‍රය කුඩා කණ්ඩායම්වලට බෙදීම නිර්මහාපරිමාණකරයෙන් සිදු වේ. එහිදී පාඨකයාගේ වෘත්තිය, වයස, ස්ත්‍රී පුරුෂභාවය, අධ්‍යාපන මට්ටම ආදී වර්ගීකරණය ඔස්සේ මුද්‍රිත මාධ්‍ය සන්දේශ පළවේ
  උදා: පුවත්පත්, සඟරා විවිධ විෂය ක්ෂේත්‍ර අනුව ක්‍රීඩා/ අධ්‍යාපනික/ කාන්තා/ ආගමික/ ජ්‍යොතිෂ ආදී වශයෙන් වෙන් වෙන්ව නිකුත් කිරීම
- ජාතික පුවත්පත් සමග විවිධ විෂයයන් අනුව ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පුවත් අතිරේක ලබා දීම
- නිශ්චිත ඉලක්ක ගත කණ්ඩායමකට සන්නිවේදනය කිරීම
  දේශපාලනික/ අධ්‍යාපනික/ සෞඛ්‍ය/ කෘෂිකර්ම ආදී ක්ෂේත්‍රවල සිටින පුරවැසියන් දැනුවත්වීමට අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර් ආදිය යොදා ගැනීම
- ග්‍රාහකයින්ට ප්‍රාදේශීයව තොරතුරු ලබාදීම
  උදා: Kandy / ගම්පහ / උදයන් පුවත්පත්
- ඉලක්කගත මාධ්‍ය පණිවිඩයක් තෝරා ගත් ග්‍රාහක කණ්ඩායමක් වෙත යැවීම
  උදා: ඩෙංගු, මී උණ වැනි වසංගත රෝග ව්‍යාප්ත කාලයේ දී අවදානම සහිත ප්‍රදේශවල පුරවැසියන් අත්පත්‍රිකා මගින් දැනුවත් කිරීම



Scanned with CamScanner

(ආ) සමාජ මාධ්‍ය

- ග්‍රාහක ක්ෂේත්‍රය කුඩා කණ්ඩායම්වලට බෙදීම
උදා: ව්‍යාපාරික, අධ්‍යාපනික, .දේශපාලනික, වෘත්තීමය, සේවා ස්ථාන අනුව, ප්‍රජා සංවිධාන අනුව සමාජ මාධ්‍ය තුළ කණ්ඩායම් ගොඩනගා ගැනීම (Facebook, Whatsapp)
- නිශ්චිත ඉලක්කගත කණ්ඩායමකට සන්නිවේදනය කිරීම
උදා: අධ්‍යාපනය - විෂයයන් අනුව කණ්ඩායම් සමාජ මාධ්‍ය ගොඩනගාගෙන විෂය කරුණු, ප්‍රශ්න පත්‍ර ආදිය හුවමාරු කර ගැනීම
- මාතෘකා කිහිපයක් තෝරා ගෙන සන්නිවේදනය කිරීම
උදා:

Youtube නාලිකාවල ඉවුම් පිහුම්, වෛද්‍ය සාකච්ඡා, රූපලාවන්‍ය, අධ්‍යාපනික, ධර්මදේශනා, කාටුන්, ළමා ගීත, සංචාරක, නැරඹුම් ස්ථාන ආදිය දැකගත හැකිය.

Facebook page (පිටු) ව්‍යාපාරික අවස්ථා, භාණ්ඩ හා සේවා සැපයීම, නිෂ්පාදන, දේශපාලන, කාන්තා, පුද්ගල ප්‍රතිරූප, පාරිසරික, සංස්කෘතික, කලා, ක්‍රීඩා ආදී පිටු දැක ගත හැක.

- ඉලක්කගත සන්දේශයක් තෝරාගත් ග්‍රාහක කණ්ඩායමක් වෙත යැවීම
උදා:Whatsapp Group, Instagram, Facebook ආදී සමාජ මාධ්‍ය හරහා ඉලක්කගත සන්දේශයන් තෝරාගත් ග්‍රාහකයන් සමග හුවමාරු කර ගැනීම
පාසලක අදාළ ශ්‍රේණියට, විෂයන් අනුව ශිෂ්‍යයින් සමාජ මාධ්‍යය තුළ කණ්ඩායම් කර ඒ අතර පණිවිඩ හුවමාරු කිරීම.
- Algorithm
අප වරක් සන්දේශය තෝරා ගත් විට ස්වයංක්‍රියව නැවත ඊට අදාළ සන්දේශ ගණනාවක් තිරය තුළ දිස්වීම

- පාඨකත්වය

(සම්පූර්ණ ලකුණු ලබාදීමට නිදසුන් ඇසුරෙන් පැහැදිලි කළ යුතුය.)

| | |
|---|---|
| විස්තර කිරීම ලකුණු | 6 x 2 = 12 |
| උදාහරණ දැක්වීම ලකුණු | 2 x 2 = 4 |
| මුළු ලකුණු | = 16 |



Downloaded from 'Past Papers Wiki' - Web: www.pastpapers.wiki
Scanned with CamScanner

**7. මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය විචාරය අතර සමීප සම්බන්ධතාවක් පවතී.**

**(i) සාක්ෂරතාව යනු කුමක් ද?**

ලිවීමට හා කියවීමට ඇති හැකියාව

ලකුණු = 4

**(ii) ඥාන ව්‍යුහ ගොඩනගා ගැනීමට තොරතුරු ඉවහල්වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.**

- සැලැස්මකට අනුව තොරතුරු තෝරා බේරා ගැනීම
- පුද්ගල අත්දැකීම්, රුචි අරුචිකම්, කුසලතා ආදිය තොරතුරු තෝරාගැනීමට හේතුවීම
- තොරතුරු යම් රටාවකට ගොඩනැගීම
- උචිත, ගැඹුරු, ඵලදායී තොරතුරු තුළින් ඥාන ව්‍යුහ වැඩිදියුණු කර ගත හැකිය.
- අනුචිත, නොගැඹුරු, නිශ්ඵල තොරතුරු බැහැර කිරීම
- තමා සතු කුසලතා භාවිතයට ගෙන තොරතුරු තෝරාගැනීම

~~ලකුණු 4 x 2~~ = 8

**(iii) මාධ්‍ය හා සම්බන්ධ ස්ත්‍රීවාදී විචාරයෙහි ඔබ හඳුනා ගන්නා ප්‍රධාන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න.**

- ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳව ලිංගිකත්ව සමානාත්මතා පදනමක සිට විචාරය කිරීම
- මාධ්‍ය සන්දේශ තුළ කාන්තාවට එරෙහි වෙනස්කම් සිදුකිරීම/.අවප්‍රමාණය කරන ආකාරය නිරීක්ෂණය කිරීම
- ස්ත්‍රීන් හා ස්ත්‍රීත්වය පිළිබඳ වටිනාකම් බෙදාහැරීම උදෙසා මාධ්‍ය දායක විය යුතු බව
- ස්ත්‍රීන්ගේ වටිනා බොහෝ පැති මාධ්‍ය මගින් නොසලකා හැරීම
- මාධ්‍ය ආධිපත්‍ය පුරුෂයන් සතුව පවත්නා බව හඳුනා ගැනීම
- මාධ්‍ය තුළ ස්ත්‍රිය ඒකාකෘතික ලෙස නිරූපණය කිරීම
- කාන්තාව ලිංගික භාණ්ඩයක් ලෙස නිරූපණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

ලකුණු 4 x 3 = 12



Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!
Scanned with CamScanner

| |
|---|
| (iv) මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කිරීම සඳහා පහත අංග යොදා ගන්නා ආකාරය උදාහරණ ඇසුරෙන් විමසන්න. |

(අ) අදාළ බව

- අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සන්දර්භයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස සන්දේශ ඉදිරිපත් කිරීම
- සන්දේශයට අදාළ අන්තර්ගතය, ආඛ්‍යානය, අනුක්‍රමය, සමබරතාව, සුසංයෝගය ප්‍රමාණාත්මක බව, උචිත තාක්ෂණික භාවිතය, මනා ලෙස ගළපා ඇති ආකාරය හඳුනාගැනීම
- අදාළ බව, පුද්ගල රුචි අරුචිකම් මත තීරණය වුවද වඩා වැදගත් වන්නේ මනා අවබෝධයෙන් යුතුව අදාළ බව තීරණය කිරීමයි.

(ආ) පෙළඹවීම/ අභිප්‍රේරණය

- මාධ්‍ය පෙළඹවීම මගින් පුද්ගලයා සිය ආකල්ප හා චර්යා වෙනස් කරගන්නා ආකාරය හඳුනාගැනීම.
- මාධ්‍ය මගින් පුද්ගල විශ්වාස, ආකල්ප, අභිප්‍රාය හෝ හැසිරීම කෙරහි බලපෑම් ඇතිකර පිළිගැනීමට යටත් කිරීම.
- ආකල්ප වෙනස් කිරීම, හැසිරීම් වෙනස් කිරීම, කාලයත් සමග වෙනස් කිරීම යනාදී මානයන් සඳහා පෙළඹවිය හැකිවීම.

(ඉ) විශ්වසනීයත්වය

- සන්දේශය ග්‍රාහකයා තුළ පිළිගැනීමට ලක්වන්නේ කෙසේදැයි හඳුනාගැනීම. සන්නිවේදකයා නව විශ්වාසයක් ලබා දුන්නද ලබන්නා විශ්වාස නොකරන්නේ නම් එය ප්‍රතික්ෂේප වීම.
- බහුමානීය ලෙස විශ්වසනීයත්වය හට ගැනීම සිදුවන අතර විවිධ මානයන්ට අනුව විශ්වාසය ගොඩනැගේ.
- විශ්වසනීයත්වය තක්සේරු කිරීමට සරල රීතියක් නොමැති නමුත් ඒ සඳහා විනිශ්චය වැදගත් වේ.

(ඊ) විකෘතිකරණය

- සන්දේශයක අන්තර්ගතය වෙනස් කොට ඉදිරිපත් කිරීම
- එක් පාර්ශ්වයක් විසින් වෙනත් පාර්ශ්වයකට ගෙන යනු ලබන නාලිකා හෝ විවිධාකාරයේ මැදිහත්වීම් වලින් සන්දේශ විකෘති කිරීමකට ලක්වේ.
- අතිශයෝක්තියට නැගීම, නින්දා කිරීම, අනුවර්තී වක්‍රෝක්තිකරණය, ප්‍රත්‍යක්ෂණය, පාර්ශ්වීය බව, විස්තර විශාල කිරීම, පර්යාලෝක ආදිය මගින් විකෘතිකරණය ඇතිවේ.

| | | |
|---|---|---|
| විස්තර කිරීම ලකුණු | 3 x 4 | = 12 |
| උදාහරණ දැක්වීම ලකුණු | 1 x 4 | = 4 |
| මුළු ලකුණු | | = 16 |

PAST PAPERS WIKI



WWW.PastPapers.WiKi
Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!
Scanned with CamScanner

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

**විෂය අංකය / பாட இலக்கம்:** 29

**විෂයය / பாடம்:** සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 3 | 31. | 4 | 41. | 2 |
| 02. | 4 | 12. | 4 | 22. | 4 | 32. | 3 | 42. | 4 |
| 03. | 5 | 13. | 2 | 23. | 5 | 33. | 1 | 43. | 5 |
| 04. | 4 | 14. | 2 | 24. | 2 | 34. | 4 | 44. | 3 |
| 05. | 5 | 15. | 5 | 25. | 3 | 35. | 1 | 45. | 1 |
| 06. | 1 | 16. | 5 | 26. | 4 | 36. | 1 | 46. | 5 |
| 07. | 1 | 17. | 2 | 27. | 1 | 37. | 4 | 47. | 4 |
| 08. | 4 | 18. | 3 | 28. | 3 | 38. | 5 | 48. | 5 |
| 09. | 4 | 19. | 1 | 29. | 2 | 39. | 2 | 49. | 1 |
| 10. | 3 | 20. | 5 | 30. | 3 | 40. | 3 | 50. | 3 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 50 = 50

Scanned with CamScanner

1. සන්නිවේදන අධ්‍යයනයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය මෙන්ම ජනමාධ්‍ය පිළිබඳව ද අවධානය යොමු කෙරේ.

(i) 'සන්නිවේදන අධ්‍යයනය' නම් ස්වාධීන විෂයයේ සංවර්ධනයට පසුබිම සකස් කළ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න.

- සමාජ විද්‍යාව
- දේශපාලන විද්‍යාව
- මනෝ විද්‍යාව

ලකුණු 2 x 2 = 4

(ii) සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග ලෙස සැලකෙන ආකේතකරණයේ දී හා විකේතකරණයේ දී සිදුවන්නේ කුමක් දැයි වෙන වෙනම කෙටියෙන් විස්තර කරන්න.

- **ආකේතකරණය** - සිතේ අතිවන අදහස්, හැඟීම් තවත් පාර්ශ්වයක් සමග සන්නිවේදනය කිරීම සඳහා කේත උපයෝගී කර ගනිමින් ඒවා සන්දේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය
- **විකේතකරණය** - සන්දේශයේ අන්තර්ගතය අර්ථකථනය කර අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය

ලකුණු 4 x 2 =

(iii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

- දැනුම් හා ඉගෙනුම් සම්පාදනය
- භාව ප්‍රකාශනය
- උපදේශාත්මක සංදේශ ජනනය කළ හැකිවීම
- සංස්කෘතිකාංග හුවමාරු කර ගැනීමට හැකිවීම
- අහිතකර සමාජ ප්‍රවණතා විවේචනය කිරීම
- විනෝදාස්වාදය සඳහා යොදා ගත හැකිවීම

විස්තර කිරීම ලකුණු 3 x 3
උදාහරණ දැක්වීම 1 x 3
මුළු ලකුණු

(iv) ජනසන්නිවේදනයේ පවත්නා විශේෂතා **හතරක්** අන්තර්පුද්ගල සන්නිවේදනය හා සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න.

| ජනසන්නිවේදනය | අන්තර් පුද්ගල සන්නිවේදනය |
|---|---|
| • තාක්ෂණික මෙවලම් භාවිතය | • තාක්ෂණික මෙවලම් භාවිත කර හෝ තොරව සිදුකළ හැකිවීම |
| • වෘත්තීය සන්නිවේදකයින් සිටීම | • වෘත්තීය සන්නිවේදකයින් නොවීම |
| • ප්‍රමාදිත ප්‍රතිපෝෂණය | • ක්ෂණික ප්‍රතිපෝෂණය |
| • පොදු සන්දේශ බෙදාහැරීම | • පෞද්ගලික සංදේශ හුවමාරුව |
| • බහුවිධ දොරටුපාල ක්‍රියාවලියට යටත්වීම | • නිදහසේ සංදේශ හුවමාරු කර ගැනීමට හැකිවීම |
| • සන්නිවේදක හා ග්‍රාහකයා අතර දූරස්ථභාවයක් පැවතීම | • සන්නිවේදක හා ග්‍රාහකයා අතර සමීප බවක් දක්නට ලැබීම |
| • බොහෝවිට ඒකමාර්ගික වේ | • ද්වි මාර්ගික සන්නිවේදන ක්‍රියාවලියකි |
| • ආයතනගත ව්‍යුහයක් දක්නට ලැබීම | • ආයතනගත ව්‍යුහයක් දක්නට නොලැබීම |
| • අඛණ්ඩ බවකින් යුක්ත වීම | • අවශ්‍යතාව මත පදනම් වීම |
| • විසිරුණු, පැතිරුණු පුළුල් ග්‍රාහක ක්ෂේත්‍රයක් පැවතීම | • එසේ නොවීම |

ලකුණු 4 x 4 =

**2. (i) මානව සන්නිවේදනයේ දී නාලිකා ලෙස භාවිත කරන්නේ මොනවා ද?**

පංචේන්ද්‍රිය

(පංචේන්ද්‍රියට අයත් අංග තුනකට වඩා ලියා ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න)

ලකුණු = 4

**(ii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.**

- කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගැනීම
- ප්‍රස්තුත කරුණු පිළිබඳව වැඩිදුර දැනුවත් කිරීම
- ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට
- විවිධ පාර්ශ්වවල අවධානය දිනා ගැනීමට
- මතවාද නිර්මාණය කිරීමට

ලකුණු 4 x 2 = 8

**(iii) නිර්මාණශීලී රචනය පහත සාධක ඇසුරෙන් ලුහුඬින් විස්තර කරන්න.**

**(අ) නිර්මාණශීලී රචනාවක අරමුණු**

රසිකයාට, සිතුවිලි, හැඟීම් හා රස ලබා දෙමින් භාව පූර්ණ චිත්ත තත්වයක් ඇති කිරීම

**(ආ) නිර්මාණශීලී රචනා වර්ග**

ගීතය, නව කතාව, කෙටි කතාව, චරිතාපදාන, සාහිත්‍ය විචාර, තිර රචනය, ගුවන් විදුලි පිටපත් රචනය, තීරු ලිපි, විශේෂාංග, වෙළඳ දැන්වීම් පිටපත්

**(ඉ) නිර්මාණශීලී භාෂා ශෛලිය**

රසවත්වීම, ව්‍යංගාර්ථ පූර්ණ වීම, පරිකල්පනය පුබුදු කරවීම, ග්‍රාහක සිත් සනසවන සූළු බව, සිනහව, ප්‍රහර්ෂය, සන්තාපය වැනි සංවේදනා ඇති කරවන

ලකුණු 4 x 3 = 12

**(iv) මහජන සම්බන්ධතා මෙවලම් දෙකක් හා විධික්‍රම දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.**

| මෙවලම් | විධික්‍රම |
|---|---|
| • ප්‍රවෘත්ති නිවේදන | • තෑගි ලබාදීම |
| • මාධ්‍ය කට්ටල | • සම්මාන පිරිනැමීම |
| • පොත් පිංච | • දිරි දීමනා |
| • විස්තර පත්‍රිකා | • උපදේශනය |
| • පුවත් හසුන | • අරමුදල් ලබාදීම |
| • වාර්ෂික වාර්තා | • මහජන මතය විමසීම |
| • ඡායාරූප | • විශේෂ සිද්ධි කළමනාකරණය |
| • වීඩියෝ සම්බන්ධතා | |
| • වීඩියෝ ප්‍රවෘත්ති නිකුත් කිරීම | |
| • අන්තර්ජාල මහජන සම්බන්ධතා | |
| • විද්‍යුත් මාධ්‍ය කට්ටල | |
| • විද්‍යුත් මාධ්‍ය මධ්‍යස්ථාන | |

මෙවලම් දෙකක් විස්තර කිරීම ලකුණු 3 x 2 = 6

උදාහරණ දැක්වීම ලකුණු 1 x 2 = 2

විධික්‍රම දෙකක් විස්තර කිරීම ලකුණු 3 x 2 = 6

උදාහරණ දැක්වීම ලකුණු 1 x 2 = 2

මුළු ලකුණු 16



Scanned with CamScanner

**3. පාසල් සිසුන්ගේ කාව්‍ය නිර්මාණ ඇතුළත් කර සම්පාදනය කළ ග්‍රන්ථයක දොරට වැඩුම සඳහා සහභාගී වීමට ඔබට ආරාධනයක් ලැබී ඇත.**

**(i) කාව්‍ය නිර්මාණකරණය සඳහා භාවිත වන සන්නිවේදන වර්ගය කුමක් ද?**

අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය

ලකුණු = 4

**(ii) ඉහත (i) හි ඔබ සඳහන් කරන ලද සන්නිවේදන වර්ගය භාවිත කිරීමේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.**

- පෞරුෂ වර්ධනයට
- ස්ව - සංකල්පය පෝෂණයට
- චින්තනය ගොඩනංවා ගැනීමට
- ආත්ම විශ්වාසය ගොඩනැගීමට
- තීරණ ගැනීමට
- විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමට
- නිර්මාණශීලීත්වය ඔප් නංවා ගැනීමට
- ස්මරණය කිරීමට

(කෙටියෙන් විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න)

ලකුණු 4 x 2 = 8

**(iii) නිර්මාණකරණය සඳහා වැදගත්වන ගුණාංග දෙකක් පහතින් දැක්වේ. ඒවා පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.**

(අ) **පරිකල්පනය** - නිර්මාණකරණය සඳහා අවශ්‍ය සංකල්ප, චිත්ත රූප ගොඩනගා ගනු පිණිස නිර්මාණකරුවෙකු සතු ශක්තියයි. නිර්මාණාත්මකව අත්දැකීම් ඇසුරෙන් නිර්මාණයක් බිහි කිරීමේ දී පරිකල්පනය භාවිත කරමින් නිර්මාණාත්මක චින්තනයෙහි යෙදෙයි. තමා නිර්මාණය කිරීමට අපේක්ෂා කරන නිර්මාණයෙහි තේමාව හා මූලික දළ සැලැස්ම යනාදිය පිළිබඳ රූපයක් තම මනසෙහි ඇති කර ගැනීම.

(ආ) **සතතාභ්‍යාසය** - අඛණ්ඩව සිදු කරන අභ්‍යාසය යි. පුද්ගලයා තුළ විභව ශක්තියක් තිබුනද එය සංවර්ධනය කර ගැනීමට අභ්‍යාසය වැදගත් වේ. එය තමා විසින්ම සිදු කරගත යුත්තකි. මෙමගින් පරිකල්පනය වඩා සියුම් හා තියුණු තත්වයකට පත් කරගත හැකිය.

ලකුණු 6 x 2 = 12



Scanned with CamScanner